# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2252/26 - 2021 නොවැම්බර් මස 03 වැනි බදාදා - 2021.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011 (iii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වන වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහාමාර්ග අමාත්‍ය, ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු වන මා විසින්, 2021 ඔක්තෝබර් මස 28 වැනි දිනැති අංක 2251/38 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් "අධිවේගී මහා මාර්ගයක්" බවට නම් කරන ලද සහ මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "මීරිගම - කුරුණෑගල ජාතික මහා මාර්ගය (මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස)" මේ නියමය මගින්, ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

**ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු,**
මහාමාර්ග අමාත්‍ය.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

*ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය*

මීරිගම - කුරුණෑගල ජාතික මහා මාර්ගය (මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස) ලෙස නම් කර ඇති අධිවේගී මහා මාර්ගයේ මීරිගම (කි.මී. 36.981) සහ කුරුණෑගල (කි.මී. 77.891) අතර පිහිටා ඇති කිලෝමීටර් 40.910ක් දිගින් සහ මීටර් 80.000 - 100.000ක් පළලින් යුතුව විහිදෙන මාර්ග කොටස වේ.

11 - 367


1A - PG 5591 — 110 (2021/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*